ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
University of Sri Jayewardenepura, Sri Lanka

බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය
External Degrees and Extension Courses Unit (EDECU)

මගේ අංකය : EEX - 10
My Number

නුගේගොඩ , ශ්‍රී ලංකාව
Nugegoda , Sri Lanka

ඔබේ අංකය :
Your Number

දුරකථන : 5929790, 2758233
Telephon

ෆැක්ස් : 2802753

2019.10.17

ප්‍රිය ශිෂ්‍ය ශිෂ්‍යාවනි,

**විද්‍යාවේදී කළමනාකරණ (රාජ්‍ය) සාමාන්‍ය (බාහිර) උපාධි පාඨමාලාව 2019**

**නම්නීකරණ වැඩසටහන**

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ 2019 විද්‍යාවේදී කළමනාකරණ (රාජ්‍ය) සාමාන්‍ය (බාහිර) උපාධි පාඨමාලාව සඳහා ලියාපදිංචි වූ ඔබ සැම ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයීය බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය හා රාජ්‍ය පරිපාලන විද්‍යා අධ්‍යයනාංශය වෙනුවෙන් සාදරයෙන් පිළිගනිමි.

මෙම බාහිර උපාධි පාඨමාලාවේ අධ්‍යයන කටයුතු සිදු කෙරෙන ආකාරය, විශ්වවිද්‍යාලය මඟින් සම්මන්ත්‍රණ හා විභාග පැවැත්වීම, විද්‍යුත් ඉගැනුම් පද්ධතිය සහ අන්තර්ජාලය ඔස්සේ සිදු කෙරෙන දුරස්ථ අධ්‍යයන වැඩසටහන සහ අනෙකුත් අවශ්‍ය තොරතුරු සම්බන්ධයෙන් ඔබව දැනුවත් කිරීම සඳහා රාජ්‍ය පරිපාලන විද්‍යා අධ්‍යයනාංශය හා බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය එක්ව නම්නීකරණ වැඩසටහනක් සංවිධානය කර ඇත.

මෙම නම්නීකරණ වැඩසටහන ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ උපකුලපතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් 2019.11.02 වන සෙනසුරාදා දින ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ බණ්ඩාරනායක ශාලාවේදී ප.ව 12.30 සිට ප.ව 3.30 දක්වා පැවැත්වීමට නියමිතය. **ඒ අනුව එදින මධ්‍යහන 12.00 වන විට නම්නීකරණ වැඩසටහන සඳහා සහභාගී වන ලෙස මෙයින් කාරුණිකව දැනුම් දෙමි.**

එදින විස්තරාත්මක විෂය නිර්දේශය, බාහිර උපාධි ශිෂ්‍ය අත්පොත, ශිෂ්‍ය වාර්තා පොත සහ විශ්වවිද්‍යාලයීය විභාග නීති රීති හා රෙගුලාසි ඇතුළත් පුස්තකයක් ලබා දීමට කටයුතු සම්පාදනය කර ඇත.

**ඔබගේ ලියාපදිංචි අංකයට නියමිත කණ්ඩායම පහතින් දක්වා ඇත. (ලියාපදිංචි අංකය මෙම ලිපියේ ලිපිනයට වම්පසින් දක්වා ඇත.)**

A කණ්ඩායම - SJP/EXP/S/201900001 - SJP/EXP/S/201900150

B කණ්ඩායම - SJP/EXP/S/201900151 - SJP/EXP/S/201900300

C කණ්ඩායම - SJP/EXP/S/201900301 - SJP/EXP/S/201900450

D කණ්ඩායම - SJP/EXP/S/201900451 - SJP/EXP/S/201900600

E කණ්ඩායම - SJP/EXP/S/201900601 - SJP/EXP/S/201900783

**නම්නීකරණ වැඩසටහනට සහභාගි වන විට විශ්වවිද්‍යාලයෙන් ශිෂ්‍ය ලියාපදිංචිය වෙනුවෙන් ලබා දුන් ලිපිය, ජාතික හැඳුනුම්පත හා මෙම ලිපිය රැගෙන මධ්‍යහන 12.00 ට පැමිණීම අනිවාර්ය වේ.**

**විධිමත් ඇඳුමකින් සැරසී නම්නීකරණ වැඩසටහනට සහභාගි වියයුතු බව වැඩිදුරටත් දන්වමි.**

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි